**උතුරු මාර්ග පුනරුත්ථාපනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම) - 2014**

---

උතුරු මාර්ග පුනරුත්ථාපනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ චීන අපනයන - ආනයන බැංකුව අතර 2010 සැප්තැම්බර් 09 දින එළඹි අංක බීඑල්ජ් 201005 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය මහාමාර්ග හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කාර්යයන් කළමනාකරණය හා සම්බන්ධීකරණය කිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම වේ. මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ කිලෝමීටර් 42.4 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම එජඩො මිලියන 50.3 ක් වූ අතර ඉන් එජඩො මිලියන 42.8 ක් හෝ සියයට 85 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2010 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර 2013 අගෝස්තු 14 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2013 අගෝස්තු 13 දින මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ පුනරුත්ථාපන වැඩ කොටස සම්පූර්ණ කර මාර්ග සංවර්ධන අධිකාරිය භාර ගෙන තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් අනිකුත් මාර්ග පුනරුත්ථාපන කටයුතු අඛණ්ඩව කරගෙන ගොස් තිබුණු අතර 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යනබව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1. ගිණුම්කරණ අඩුපාඩු

---

උපදේශන හා සිවිල් වැඩ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරු හා ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති අරමුදලින් වාහන, උපකරණ, ලී බඩු ආදී වත්කම් මිලදී ගැනීම් ව්‍යාපෘතියේ වත්කම් වේ. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකයන් මාර්ගයෙන් මිලදීගත් වාහන හා උපකරණ ආදී වත්කම් වල වටිනාකම වෙනම හඳුනාගෙන ගිණුම්ගත කරනවා වෙනුවට නිමකළ සිවිල් වැඩ යටතේ පෙන්නුම් කර තිබුණි.

### 2.2.2. නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියේ පොදුකාර්ය පිරිවැය අයකිරීමක් ලෙස රු.මිලියන 1.21 ක් ව්‍යාපෘතිය විසින් ප්‍රේෂණය කර තිබුණි. තවද එකී චක්‍රලේඛයේ 8.6 වගන්තිය ප්‍රකාර අනුමැතිය නොමැතිව, ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට රු.171,734 ක ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි. ඉහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා මගේ පෙර විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, ඒ සඳහා පිළියම් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදීද එම පරිචයන් අඛණ්ඩව අනුගමනය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---

## 3.1 අරමුදල් උපයෝජනය

---

සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් මූල්‍යයනය හා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| චීන එක්සිම් බැංකුව | 42.80 | 5,777 | 10.25 | 1,342.2 | 41.05 | 5,315.2 |
| ශ්‍රී.ලං.ර. | 7.50 | 1,059 | 0.11 | 14.8 | 7.54 | 972.8 |
| | 50.30 | 6,836 | 10.36 | 1,357.0 | 48.59 | 6,288.0 |

## 3.2 භෞතික ප්‍රගතිය

---

මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ කිලෝමීටර් 42.4 ක පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වැඩ නිමකර 2013 අගෝස්තු 13 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද 2013 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 116.79 ක් දරමින් මූලික වැඩ සැලැස්මෙහි ඇතුලත් නොවූ නයාරු සහ අලම්පිල් පාලම් ඉදිකිරීම, මුලතිව් අභ්‍යන්තර මාර්ග පුනරුත්ථාපනය සහ පුදුකුඩුරිප්පු - ඔඩ්ඩුසුඩාන් සහ පදවිය සිරිපුර මාර්ගය පුනරුත්ථාපනය ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී කොහොඹගස් හන්දියේ සිට

නෙළුම්වැව දක්වා කිලෝමීටර් 19.8 ක ප්‍රාදේශීය මාර්ග පුනරුත්ථාපනය සඳහා රු. මිලියන 824.31 ක් වියදම් කර තිබුණි. මෙම අමතර වැඩ ප්‍රධාන වැඩවල විචලතා ලෙස සැලකුවද අදාල පාර්ශවයන්ගෙන් එම වැඩ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ කිලෝමීටර් 42.4 ක පදික වේදිකාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රමාණපත්‍ර අනුව රු. මිලියන 2,019 ක් වෙන්කර තිබුණු නමුත් 2013 අගෝස්තු 13 දින ඉදිරිපත් කරන ලද අවසන් අන්තර් ගෙවීම් සහතිකය අනුව රු. මිලියන 367.75 ක් පමණක් මේ සඳහා වියදම් කර තිබුණි. බොරළු හා ද්විත්ත්ව තාර මතුපිට ඇතිරීමේ ප්‍රතිකර්මය (Double Bitumen Surface Tread) වෙනුවට Aggregate Base Course ලෙස වැඩ විෂය පථය වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිපාදන ඉතිරිය සිදුවූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් පැහැදිලි කරන ලදී. කෙසේ වෙතත් අතාත්වික පිරිවැය ඇස්තමේන්තු මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගණනය කිරීම හා වැඩිපුර ගෙවීම් කිරීම සිදුකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ) කොන්ත්‍රාත් කොන්දේසි 13.6 පරිදි සුළු හා අනියම් ස්වරූපයේ වැඩවල විචලනයන් දෛනික වැඩ පදනම මත ක්‍රියාත්මක කළහැකි අතර ඒ වෙනුවෙන් ප්‍රමාණ පත්‍රයේ රු. මිලියන 9ක් වෙන්කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වැඩ අවසන් කිරීමේ නිවේදනය අනුව යථෝක්ත ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 16 කට දෛනික වැඩ පදනම මත වැඩ විචලනයන් ඉල්ලුම් කර තිබුණි. තවද මෙම බොහෝ කාර්යයන් සුළු හෝ අනියම් ස්වරූපයේ වැඩ නොවන බව තවදුරටත් අනාවරණය වූ එම විචලනයන් සඳහා විධිමත් විචලන ඇනවුම්ද නිකුත් කර නොතිබුණි.

(ඇ) කොහොඹගස් හන්දියේ සිට නෙළුම් වැව මාර්ගයේ කිලෝමීටර් 17+000 සිට කිලෝමීටර් 19+000 දක්වා කොටසෙහි බොහෝ ඉරිතැලීම් හා හානි සිදුවී තිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ බැවින් මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල ගුණත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

---------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු. මිලියන 2.74 ක විශේෂ ණයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් 2014 ජුනි 27 දිනට මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු නිමකර තිබුණු නමුත් ණය මුදල නිරාකරණය කිරීමට ක්‍රියා කර නොතිබුණි.